**රඹෑව ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

**---------------------------**

## 01. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 10 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රඹෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

**-----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේදී සභාවට ලබාදී තිබුණු රු.41,654,000 ක් වූ වාහනවල අගය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.167,125 ක් වූ පුස්තකාල පොත් අගය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු.417,806 ක් වූ උපකරණ, ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) එකතුව රු.8,200,000 ක්වූ නව කාර්යාල ගොඩනැගිල්ල,ආපනශාලා ගොඩනැගිල්ල සහ පිහිඹියගොල්ලෑව සතිපොල ගොඩනැගිල්ල ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2013 සහ 2014 වර්ෂවලට අදාලව අයවිය යුතු රු.543,300 ක් වූ මුද්දර ගාස්තු ආදායම 2015 වර්ෂයේදී හඳුනාගෙන තිබුණද, එම අගය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.4,136,416 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.736,552 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 වරිපනම් බදු

--------------

සභාවේ වරිපනම් බදු ලේඛනය අනුව වරිපනම් බදු අයකරනු ලබන ඒකක 319 කින් 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.206,502 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 බදු කුලී

---------

සභාව සතු වෙළඳ ස්ථාන 04 ක් සමාලෝචිත වර්ෂයට බදු ගෙන තිබුණු බදුකරුවන් 04 දෙනෙකු විසින් ගෙවීම පැහැර හැර තිබුණු රු.1,294,033 ක මුදල අයකර ගැනීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

#### 2.2.3 මුද්දර ගාස්තු

---------------

2013 හා 2014 වර්ෂ සඳහා හදුනා ගන්නා ලද රු.543,300 ක හිඟ මුද්දර ගාස්තු ආදායම අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) එකතුව රු.25,500,790 ක්වූ ගිණුම් ශේෂ 17 ක් නිශ්චිත වශයෙන්ම හඳුනා ගැනීමකින් තොරව 2013 වර්ෂයේ හෝ ඊට පෙර සිට දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් තිබුණු අතර නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 100 තුලාන, රඹෑව පොදු සුසාන භූමියේ අයිතිය පවරා ගැනීමට පෙර වැට ඉදිකිරීමට ද්‍රව්‍ය ලබාගැනීම සඳහා රු.249,685 ක් වැයකර ඇතත් ලබාගත් ද්‍රව්‍ය අදාල කාර්යය සඳහා යොදවා නොතිබුණි.

(ඇ) රඹෑව සතිපොල ඉඩම,මහමල්ගොල්ලෑව සතිපොල ගොඩනැගිල්ල,රඹෑව නගරයේ පොදු වැසිකිලි ඉඩම සහ ගොඩනැගිල්ල යන වත්කම්වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59 ප්‍රකාරව සෑම වර්ෂයක් ආරම්භයේදී සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ඉ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/2002/02 භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

## 3.2 ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සභා බල ප්‍රදේශය තුළ පිහිටි වෙළඳ ව්‍යාපාර ස්ථානවලින් හා නිවෙස් වලින් බැහැර කරන කසල විධිමත්ව එකතු කර ඝනඅපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ වැඩපිළිවෙලක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.3 බලය නොලත් ගණුදෙනු

-----------------------------

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2014 නොවැම්බර් 14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2014/25 ට පටහැනිව සභාවේ සේවකයින් 14 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී තිබුණි. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි උතුරු මැද පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ 2015 නොවැම්බර් 30 දිනැති අංක 3/1/(1)-5 වෙළුම දරණ ලිපිය අනුව එම ස්ථිර පත්වීම් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කරන ලෙස දැන්වීමෙන් පසු 2016 අප්‍රේල් 01 දින සිට එම පත්වීම් අහෝසි කර ඇත. එම ස්ථිර පත්වීම් ලද දින සිට අහෝසි කරන තෙක් එකතුව රු.7,153,228 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

## 3.4 නිශ්ක්‍රීය වත්කම්

-------------------

සභාව සතු වටිනාකම රු.856,800 ක් වූ යන්ත්‍ර හා උපකරණ 03 ක් භාවිතයට නොගැනීම හේතුවෙන් වර්ෂ ගණනාවක් තිස්සේ නිශ්කාර්යව පැවතුණි.

## 04. පද්ධති හා පාලනය

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය